www.agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Department of Education – Western Province**

දෙවන වාර අවසාන ඇගයීම - 2018
**Second Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය Grade } 06 | විෂයය Subject } ගණිතය | පත්‍රය paper } I,II | කාලය Time } පැය 02 |

නම :-……………..……………………………… විභාග අංකය :-……………..……………

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 02 බැගින් හිමි වේ.

1. දිනය සම්මත ආකාරයට ලියා ඇත්තේ පහත සඳහන් කවර අවස්ථාවේදැයි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
   (a) 1948-2-04 (b) 1948-02-04 (c) 48-02-04


2. දාර 12 ක්, ශීර්ෂ 8 ක්, මුහුණත් 6ක් ඇති මුහුණත්වල හැඩය සමචතුරස්‍රාකාර වූ ඝන වස්තුවේ නම ලියන්න. ……………………………………

3. එකතු කරන්න

| $l$ | $ml$ |
|---|---|
| 3 | 856 |
| + 4 | 84 |
| | |

4. අඩු කරන්න.

| පැය | මිනිත්තු |
|---|---|
| 8 | 20 |
| - 5 | 40 |
| | |


5. 


වෘත්තය මත A ලක්ෂ්‍යය පිහිටා ඇත.
   i. වෘත්තයෙන් පිටත …………. ලක්ෂ්‍යය පිහිටා ඇත.
   ii. වෘත්තය තුළ …………. ලක්ෂ්‍යය පිහිටා ඇත.

6. "දහඅට බිලියන තුන" ඉලක්කමෙන් ලියන්න. ……………………..………

7. පියල් ළඟ රුපියල් 850 ක් ඇත. ඉන් රුපියල් 675 ක් වියදම් කරයි. ඉතිරි මුදල කොපමණද?
   ……………………

8. 77 ආසන්න දහයේ ගුණාකාරයට වටයන්න. …………………………

9. 



නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
   i. a සුළු කෝණයකි. b සෘජුකෝණයකි.
   ii. a මහා කෝණයකි. b සුළු කෝණයකි.
   iii. a සුළු කෝණයකි. b මහා කෝණයකි.



agaram.lk


Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

10.




හිස් කොටු තුලට ගැලපෙන දිශාවන් කොටුව තුල ලියන්න.

11.




A හා B කාණ්ඩ දෙකකට වෙන්කර ඇති ද්‍රව්‍ය සඳහා සුදුසු නම් යෝජනා කරන්න.

A.…………………………… B.……………………………


12. 13075 m කිලෝමීටර් හා මීටර් වලින් ලියන්න. …………………………

13. ප්‍රථමක සංඛ්‍යාවක් වන ඉරට්ට සංඛ්‍යාව කුමක්ද? …………………………

14. කාසියක ඝනකම සොයා ගැනීමට වඩාත් සුදුසු දිග මනින ඒකකය පහත ඒකක අතරින් කවරක්ද? නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

i mm ii cm iii m

15.



මෙම පතරමෙන් සාදා ගත හැකි ඝන වස්තුවේ,

i. නම කුමක්ද? ………………………………………

ii. ශීර්ෂ ගණන කීයද? …………………………………


16. "හතර දෙකට වඩා විශාල වේ" මෙම ප්‍රකාශනය අසමානතා ලකුණ යොදා ලියා දක්වන්න

……………………

17. සංඛ්‍යාවක් ආසන්න දහයේ ගුණාකාරයට වටැයූ විට 90කි. එම සංඛ්‍යාව සඳහා විය හැකි

උපරිම අගය = ……………….. අවම අගය = ……………….. වේ.

18.




සරල කෝණයට වඩා වැඩි, සෘජුකෝණ හතරකට වඩා අඩු වූ කෝණය දක්වෙන අක්ෂරය යටින් ඉරක් අඳින්න.

i a ii. b iii c iv d

19. $\frac{6}{18}$ ට තුල්‍ය භාග 2ක් ලියන්න.

……………………………………………

20. $29.5 + 9.87$ අගය සොයන්න. …………………………




agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද අනෙක් සෑම ප්‍රශ්නයකටම ලකුණු 11 බැගින්ද හිමිවේ.
- පිළිතුරු වෙනම කඩදාසිවල ලියන්න.

1. සංඛ්‍යා වර්ග හා සංඛ්‍යා රටා පාඩමේදී සාකච්ඡා කරන ලද ඔත්තේ සංඛ්‍යා, ඉරට්ට සංඛ්‍යා, ප්‍රථමක සංඛ්‍යා, සංයුක්ත සංඛ්‍යා, සමචතුරස්‍ර සංඛ්‍යා, ත්‍රිකෝණ සංඛ්‍යා ආශ්‍රිත විෂය කරුණු මතකයට නගා ගන්න.

a) නිමල් පේළියක ඇති තිත් හා තීරයක ඇති තිත් සමානව දක්වමින් සංඛ්‍යා රටාවක පළමු අවස්ථා හතර ඇඳ ඇත්තේ පහත පරිදිය.



I. ඉහත ඇඳි රටාව අනුව පස්වන අවස්ථාව තිත් මගින් නිරූපණය කරන්න.

II. පළමු අවස්ථා පහෙහි ඇති තිත් ප්‍රමාණයන් පිළිවෙලින් ලියන්න.

III. එම සංඛ්‍යා මගින් නිරූපණය කරන්නේ කවර වර්ගයේ සංඛ්‍යා රටාවක්ද?

IV. එම රටාවේ 9 වැනි සංඛ්‍යාව කීයද?

V. 144 වන්නේ එම රටාවේ කීවැනි සංඛ්‍යාවද?

b) $1+2+3+4+5+6+7 = 28$
හත්වන ත්‍රිකෝණ සංඛ්‍යාව වූ 28 ඉහත පරිදි ලබාගත හැක.

I. 8 වන ත්‍රිකෝණ සංඛ්‍යාව කීයද?

II. 55 වන්නේ කීවෙනි ත්‍රිකෝණ සංඛ්‍යාවද?

III. 10ත් 20ත් අතර ඇති ප්‍රථමක සංඛ්‍යා සියල්ල ලියන්න.


2. සුළු කරන්න.

a) I. $4987 + 92$   III. $430 \times 10$   V. $854 \times 37$

II. $9000 - 376$   IV. $35000 \div 100$

b) $839 \div 10$ ලබ්ධිය හා ශේෂය ලියන්න.

3. සංඛ්‍යා නිරූපණය කිරීමට යොදාගන්නා පහත අන්දමේ රේඛාවක්, සංඛ්‍යා රේඛාවක් ලෙස හඳුන්වයි.




I. නිවැරදිව අඳින ලද සංඛ්‍යා රේඛාවක ලක්ෂණ 3 ක් ලියන්න.

II. සංඛ්‍යා රේඛාවක් නිවැරදිව ඇඳ 0, -3, 3,-1 ලක්ෂ්‍ය එහි ලකුණු කරන්න.

III. 0, -3, 3,-1 නිඛිල ආරෝහණ පටිපාටියට ලියන්න.

IV. “>” හෝ “<” අසමානතා ලකුණු නිවැරදිව යොදමින් පහත හිස්තැන් පුරවන්න.

a) -7…… 3   b) 0 ……….. -8   c) -5 ……… -9

4. I. හරය 10 හා ලවය 3 වූ භාගය ලියා දක්වන්න.

II. හරය 5 ක් වූ ඒකක භාගය ලියා දක්වන්න.

III. ඉහත (II) හි ලියූ ඒකක භාගයට තුල්‍ය භාගයක් ලියන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


IV. $\frac{5}{13} + \frac{2}{13} + \frac{4}{13}$ හි අගය සොයන්න.


V. $\frac{7}{8} - \frac{1}{4}$ හි අගය සොයන්න.


VI. ඒකක භාග දෙකක එකතුව $\frac{8}{15}$ කි. එම ඒකක භාග දෙක ලියා දක්වන්න.

5. පහත ප්‍රකාශන නිවැරදි නම් ✓ ලකුණද වැරදි නම් × ලකුණද වරහන් තුළ යොදන්න.


a)

I.  මෙය චතුරස්‍රයකි. ( )

II.  මෙය සංවෘත රූපයකි. ( )


III.  ඍජුකෝණාස්‍රයක සියලු කෝණ සමාන වේ. ( )

IV.  රූපයේ දක්වා ඇති කෝණය සරල කෝණයකි. ( )

V.  සමාන්තරාස්‍රයක සියලු පාද දිගින් සමාන වේ. ( )

b) I. සමචතුරස්‍රයක පරිමිතිය 48 cm වේ. එහි පාදයක දිග කොපමණද?


II. ඍජුකෝණාස්‍රයක දිග 17 cm හා පළල 13 cm නම් පරිමිතිය ගණනය කරන්න.

III. 7 cm  මෙම රූපයේ පරිමිතිය ගණනය කරන්න.

18 cm

6.

I. එකසිය දහ අටයි දශම බින්දුවයි තුන ඉලක්කමෙන් ලියන්න.




II. ගණක රාමුවේ නිරූපණය කර ඇති සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

III. ගණක රාමුවේ දක්නට ඇති සංඛ්‍යාව අකුරින් ලියන්න.

IV. $\frac{3}{10}$ හා $\frac{7}{100}$ යන භාග දශම සංඛ්‍යා ලෙස ලියා දක්වන්න.

V. $53.7 - 8.98$ අගය සොයන්න.

7. $28 = 1 \times 28$, $28 = 2 \times$ ……... , $28 = 4 \times$ ……….

I. හිස්තැනට අදාල පූර්ණ සංඛ්‍යාව යොදමින් ප්‍රකාශන සම්පූර්ණ කරන්න.

II. 28හි සාධක සියල්ල ලියන්න.

III. 9, 28හි සාධකයක් ද? පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

IV. 357☐ ඉලක්කම් හතරකින් යුතු මෙම සංඛ්‍යාව ඉතිරි නැතිව 5න් බෙදේ. හිස් කොටුවට තිබිය හැකි ඉලක්කම් මොනවාද?

V. පොල් ගෙඩියක මිල රුපියල් 70 කි. පොල් ගෙඩි 6 ක මිල සොයන්න.



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!